**ගොවිජන සංවධර්න අරමුදල - 2023**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවිජන සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සියයට 20 ක් වූ රු. 6,252,404 ක් වූ අක්කර බදු දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි. | 2023 වර්ෂයට තවදුරටත් අයවිය යුතු ලෙස ඉදිරිපත් කර තිබූ රු.7,205,581.74 ක මුදල ලැබිය යුතු අක්කර බදු ආදායමට ගලපන ලදී. | වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ ට්‍රැක්ටර් හා ජල පොම්ප ආදායම වූ එකතු රු. 7,784,846 ක් සමුච්චිත අරමුදලට ගැලපුම් නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී අදාල ගැලපීම සිදුකර මෙම වරද නිවැරදි කරන ලෙස අදාල පාර්ශවයන්ට උපදෙස් දී ඇත. | ආදායම් නිවැරදිව ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ට්‍රැක්ටර් වෙන්දේසි ආදායමින් ලැබූ රු. 4,776,277 ක මුදල ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු වුවද අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2024 වර්ෂයේදි අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු ආදායම යැවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 පැහැදිලි නොකළ වෙනස්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු. 369,653,301 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු. 370,305,448 ක් වූයෙන් රු. 652,147 ක වෙනසක් විය. | 2008 වර්ෂයේදී දෙපාර්තමේන්තු ප්‍රධාන ගිණුම හා ගොවිජන සංවර්ධන අරමුදලෙහි ගිණුම ඒකාබද්ධ කොට ඇති අතර එසේ ඒකාබද්ධ කිරීමට පෙර රු. 651,797/- ක වෙනස ඇති වී ඇත. ඊට අදාල ලිපිලේඛන ඉතා පැරණි වීමත් එම ලිපිලේඛන සොයා ගැනිමට පවතින දැඩි දුෂ්කරතාවය සහ ඒ සඳහා විශාල කාලසීමාවක් ගතවිමත් හේතුවෙන් මෙම වෙනස නිරවුල් කොට මූල්‍ය ප්‍රකාශන මගින් ගැලපීම් සිදුකිරිම මේ වන තෙක් ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත් ඉදිරියේදි මෙම වරද නිවැරදි කිරිමට අවශ්‍ය පියවර ගන්නා මෙන් නිලධාරින් දැනුවත්කර ඇත. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල පොම්ප ණයගැති ගිණුම්, ට්‍රැක්ටර් ණයගැති ගිණුම්, ලැබිය යුතු හා ගෙවිය යුතු අවසරපත් ගිණුම් යන ලෙජර් ගිණුම්වල ශේෂයන් හා උපලේඛන අනුව ශේෂයන් අතර රු. 24,695,561 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස 2024 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සමග උප ලේඛන ශේෂයන් සමාන විය යුතුය. |

### 1.5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| පිරිවැය රු. 94,705,118 ක් වූ දේපළ පිරියත හා උපකරණ සඳහා වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර උපලේඛන ද ඉදිරිපත් කර නොතිබූ බැවින් නිරවද්‍යතාවය තහවුරු නොවීය. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමේදි අදාල උපලේඛන ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | දේපළ පිරියත හා උපකරණ සඳහා උපලේඛන පවත්වාගත යුතුය. |

### 1.6. ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා අයවිය යුතු රු.4,112,575 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාරික අයකර ගැනිම සඳහා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයන්හි අදාල පාර්ශවයන් දැනුවත් කර උපදෙස් ලබාදී ඇති අතර, ඊට අදාල වාරික අයවීමේ සීඝ්‍රතාවය අඩු මට්ටමක පැවතියද මේ වන විට වාරික ක්‍රමයෙන් අයවෙමින් පවතී. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ ලබාදී ඇති රෝද 02 ට්‍රැක්ටර් සඳහා අයවිය යුතු මුදල් 2015 වන විට අයකර ගත යුතු වුවත් රු.105,097,886 ක මුදලක් ගොවීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාරික අයකර ගැනිම සඳහා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයන්හි අදාල පාර්ශවයන් දැනුවත් කර උපදෙස් ලබාදී ඇති අතර ඊට අදාල සීඝ්‍රතාවය අඩු මට්ටමක පැවතියද මේ වන විට ක්‍රමයෙන් අය වෙමින් පවතින බව දන්වා සිටිමි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ණයගැති ශේෂය තුළ ඇතුළත් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු. 2,433,883 ක 2KR ව්‍යාපෘතියේ ජල පොම්ප වාරික හා රු. 19,240,247 ක රෝද 04 ට්‍රැක්ටර් වාරික ශේෂයන් ගොවීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | එම |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 371(2) | 2019 වර්ෂයේදී ලබාගත් රු.170,000 ක්ද සමාලෝචිත වර්ෂයේදී ලබාගත් රු.574,460 ක අත්තිකාරම්ද රෙගුලාසි ප්‍රකාරව පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම තත්කාර්ය අතුරු අග්‍රිම 2024 වර්ෂයේ පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදි. | තත්කාර්ය අතුරු අග්‍රිම දෙන ලද කාර්යය නිම කළ වහාම පියවීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 633(1) | රු.23,804,800 ක් වටිනා උප පත්‍රිකා පොත් 60,000 ක් රෙගුලාසියට පටහැනිව පෞද්ගලික මුද්‍රණ ආයතයකින් මුද්‍රණය කරවාගෙන තිබුණි. | උප පත්‍රිකා පොත් මුද්‍රණය කිරීම සඳහා (මූල්‍යම වැදගත්කමක් ඇති උප පත්‍රිකා පොත්) වාචිකව රජයේ මුද්‍රණාලයෙන් විමසීම් කරනු ලැබූ අතර, අප විසින් ඉල්ලුම් කරන දින වන විට පොත් මුද්‍රණය කිරීමට හැකියාවක් නොමැති බව පවසන ලදි. එම නිසා පොත් මුද්‍රණය කිරීම පෞද්ගලික ආයතනයකින් සිදු කර ගැනීමට කටයුතු කරන ලදි. ඉදිරියේදී අදාල මුද්‍රණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් මු.රෙ 633 ප්‍රකාරව කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. | නීති රීති, රෙගුලාසි වලට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |
| (iii) | මු.රෙ. 876(3) | රෙගුලාසියට ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් අහෝසි කිරීමට හෝ තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කළ යුතු වුවත් අරමුදල සඳහා එසේ සිදුකර නොතිබුණි. | මේ වන විට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු සිදුකරන අතර, අනුමැතිය ලැබීමෙන් පසු ගොවිජන සංවර්ධන අරමුදල සඳහා ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු සිදුකරනු ලැබේ. | නීති රීති, රෙගුලාසි වලට අනුව අරමුදල පවත්වාගෙනයාම සිදුකළ යුතුය. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.94,705,118 ක් වන දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.94,705,118.00 ක් වන දේපල පිරියත හා උපකරණ වෙනුවෙන් ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව දන්වමි. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.49,228,195 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 49,078,658 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 149,537 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ අයවැය යෝජනා අනුව හරිත ගෘහ ඉදි කිරීමට තෝරාගෙන තිබූ ව්‍යවසායකයින් අතුරින් පුත්තලම දිස්ත්‍රික්කයේ තෝරාගත් ව්‍යවසායකයින් 05 දෙනෙකු හට ලබාදී තිබුණු රු. 5,000,000 ක මුදල කිසිදු කාර්යයක් සිදු නොකර නැවත ප්‍රධාන කාර්යාලයට වර්ෂ අවසානයේදී ලබාදී තිබුණි. ඒ අනුව එම අයවැය යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | පුත්තලම දිස්ත්‍රික්කයේ හරිතාගාර ව්‍යාපෘතිය වෙනුවෙන් ක්ෂේත්‍ර පරික්ෂාවක් කර සක්‍යතා අධ්‍යනයෙන් පසුව ආයෝජනය කිරිම සඳහා ගොවින් තෝරා ගන්නා ලදි. අවසාන අධියරේදි ගිවිසුම්ගත වීමට ගොවියාගේ දායකත්වය වන රු.1,000,000/- මුදලක් බැංකු ගිණුමට තැන්පත් කිරිම ප්‍රතික්ෂේප කල හෙයින් 5 දෙනෙකු වෙනුවෙන් වෙන්කරන ලද මුදල් ගිණුමට බැරකර ගැනිම අත්හිටුවීමට සිදුවිය. වෙනත් ගොවින් සොයා ගිවිසුම්ගතවී මෙම මුදල් ආයෝජනය කිරිමට ප්‍රමාණවත් කාලයක් නොවූ බැවින්, වසර අවසානයේ නැවතත් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | ප්‍රතිපාදන මුදල් උපරිම ඵලදායීව යොදාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ඔක්තෝබර් මාසයේදී රු.30,970,000 ක පිරිවැයක් දරා ගොවිජන සේවා කාරක සභා සහ ගොවි බැංකු සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීමට ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව අදියර 05 ක් යටතේ මාස 07 ක් ඇතුළත අදාළ කාර්යය නිම කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින දක්වාම අදාළ කාර්යය නිමකර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා සහ ගොවි බැංකු සඳහා කලමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරිමේ කටයුතු 2022 වසරේ ඔක්තෝබර් මාසයයේදි ආරම්භ විය. එම පරිගණක පද්ධතිය ස්ථාපිත කිරිමට සැලසුම් කරනු ලැබූ අවධියේදි ඇති වූ ප්‍රායෝගික ගැටළු රාශියක් හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමට අපහසු විය.<br>ඉදිරියේදි සැලසුම් කර ඇති පරිදි පරිගණක පද්ධතිය ස්ථාපිත කිරිමට සැලසුම් යොදා ඇත. | ගිවිසුම ප්‍රකාරව කළමනාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම යටතේ ගොවිජන සේවා කාරක සභා හා ගොවි බැංකු සඳහා වෙබ් සේවාව | මේ වන විටත් පරිගණක මෘදුකාංගය පරික්ෂණ මට්ටමේ පවතින අතර, ඉදිරි කාලයේදි මෙම පරිගණක පද්ධතිය | ගොවිජන සේවා කාරක සභා හා ගොවි බැංකු සඳහා වෙබ් සේවාව හා |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් රු. 12,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද වෙබ් සේවාව ලබා ගැනීමට 2023 ජුලි 07 දින රු.1,570,000 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ගොවි බැංකු සතු මුදල් වලින් ආරක්ෂිත ඇපකරය සඳහා 2023 ජුනි 28 දින රු. 2,200,000 දරා තිබුණ ද එම කාර්ය ඉටු කර නොතිබුණි. | ස්ථාපිත කර ක්‍රියාත්මක කිරිමට කටයුතු සැලසුම්කර ඇත. | පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම නිසිපරිදි නියමිත දිනට සිදුකළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වර්ෂ 10 කට වඩා පැරණි රු.450,000 ක තොග ඌනතාවයක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම තොග ඌනතාවය 1996 වර්ෂයේ සිට ගොවිජන සංවර්ධන අරමුදලෙහි අවසන් ගිණුම් වල පෙන්නුම්කරනු ලබන අතර, මේ පිළිබඳව පරීක්ෂා කර බැලිම සඳහා පත්කර ඇති කමිටුව විසින් මීට සම්බන්ධ පාර්ශවයන්ගෙන් පරික්ෂණයක් පැවැත්වීම සුදුසු බව නිර්දේශ කර ඇත. මේ පිළිබඳ විනය අංශය දැනුවත් කර ඒ අනුව ඉදිරියේදි නිසි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය පරීක්ෂණයන් සිදු කර අලාභය අය කරගත යුතුය. |
| (ඉ) | 2010 වර්ෂයේදී ජපන් යෙන් ආධාර යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදන්කඩවල ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබාදී තිබුණු රු. 355,000 ක් වටිනා රෝද 02 ට්‍රැක්ටර් රථ 02 ක් ගොවීන්ට ලබා නොදී කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර විසින් භාවිතා කිරීම සහ සන්තකව තබාගැනීම නිසා ඇයට විරුද්ධව 2016 මාර්තු 10 දින විනය කටයුතු ආරම්භ කර තිබුණි. 2021 ජනවාරි 14 දින මෙම නිලධාරිනිය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 12 වගන්ති යටතේ විශ්‍රාම ගන්වා තිබුණද ට්‍රැක්ටර්වල පිරිවැය 2024 පෙබරවාරි 28 දින වන විටද අය කරගෙන නොතිබුණි. | මේ වන විට මේ සම්බන්ධයෙන් විනය අංශය විසින් අදාල ක්‍රියාමාර්ග ඉදිරියේදි ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | නොපමාව විනය ක්‍රියාමාර්ග අවසන් කිරීම හා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සංවර්ධන අරමුදලට අදාල අක්කර බදු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ අක්කර බදු ගෙවිය යුතු ඉඩම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණු බැවින් දිස්ත්‍රික් කාර්යාල විසින් ප්‍රේෂණය කරන ලද සියයට 20ක අක්කර බදු දායක මුදල නිවැරදිව ප්‍රේෂණය කරනු ලබයි ද යන්න තහවුරු කරගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | අක්කර බදු ආදායම සම්බන්ධව තීරණ ගැනිමේ බලය අදාල ඉඩම් පිහිටි ගොවිජන සංවර්ධන කමිටුව සතුවන අතර, සියළු අයකර ගැනිම් කමිටුව විසින් සිදුකරනු ලබයි. මෙම අයවීම් සම්බන්ධව පූර්ණ විස්තර ඇතුළත් ලේඛනයක් අදාල කමිටුව විසින් නඩත්තු කරනු ලබයි. මෙම ලේඛන ලංකාව පුරා විසිරි ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 565 මඟින් සිදුකරනු ලබන අතර, මෙම කමිටු 565 මඟින් නඩත්තු කරනු ලබන ලේඛන ඒකාබද්ධකර ප්‍රධාන කාර්යාලයේ | නව පරිගණක පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලේඛනයක් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවේ. ලංකාව පුරා විසිරිගිය ඉඩම් ලක්ෂ ගණනක් එක් ලේඛනයක් මඟින් නඩත්තු කිරිම ඵලදායි නොවන නිශ්ඵල කාර්යයක්ද විය හැක. එමෙන්ම එවැනි ලේඛනයක් නඩත්තු කිරිමේ අවශ්‍යතාවයක්ද පැනනොනගී. කෙසේ වෙතත් නව පරිගණක පද්ධතිය හඳුන්වා දීමෙන් අනතුරුව මෙම ගැටළුව විසදි යනු ඇත. | |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදේශය** |
|---|---|---|---|
| (අ) | අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර ආදායම් විෂයයන් 06 ක සියයට 22.46 සිට සියයට 421.47 දක්වා විචලනයන් පැවතුණි. | විචල්‍යතාවය අවම වන ලෙස වඩාත් තාර්කික ආදායම් ඇස්තමේන්තු සකස් කරන ලෙස අදාල අංශ වෙත උපදෙස් ලබා දි ඇත. | අයවැය ලේඛනය වඩා නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර විෂයයන් 05 ක සියයට 58 සිට සියයට 92 දක්වා විචලනයන් පැවතුණි. | අයවැයගත වියදම් ප්‍රකාරව විචලනය අවම වන පරිදි වියදම් සිදු කිරිම සම්බන්ධව සියලු අංශ දැනුවත් කර ඇති අතර, ඉදිරියේදි ඒ අනුව ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන බව දන්වනු ලැබේ. | අයවැය ලේඛනය වඩා නිවැරදිව සකස් කළ යුතුය. |